**කරෙයිනගර් ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 29 දිනද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 24 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කාරෙයිනගර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සුසාන භූමි 03 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට එකතු කර නොතිබුණු අතර සුසානභූමි සම්බන්ධයෙන් සිදු කළ රු.2,128,132ක්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. මේ නිසා වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | සුසාන භූමි 03හි වටිනාකම් ගිණුම්වල ඇතුළත් කිරීමට කටයුතු කරමින් පවති. | සුසාන භූමි 03හි වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට එකතු කළ යුතු වේ. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | සභාව විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | භාණ්ඩාගාර චක්‍රලේඛ මගින් කාලය දීර්ඝ කිරීම් ලබාදීමට අනුකූලව වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කෙරේ. | අදාළ පනතේ උපදෙස්වලට අනුව කාර්යසාධන වාර්තාව නියමිත කාලය තුළ මූල්‍ය වාර්තා සමග ඉදිරිපත් කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | III පරිච්ඡේදයේ 32 වගන්තිය | සභාව විසින් මේ දක්වා වරිපනම් හා බදු තක්සේරු කිරීම් කිසිවක් සිදුකර නොතිබුණි. | දේපළ තක්සේරු කටයුතු කඩිනම් කිරීමට පසුවිපරම් කටයුතු සිදුකරමින් පවති. | නියමිත කාලය තුළ වරිපනම් හා බදු අයකිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 | සභාව විසින් ලබාදී තිබූ රු. 29,440 ක් වටිනා අත්තිකාරම් මේ දක්වා නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවති. | නිරවුල් නොකළ අත්තිකාරම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය | | | |
| | 2018 ජනවාරි 24 දිනැති අංක 05/2018(1) (එ) දරන චක්‍රලේඛය මගින් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 චක්‍රලේඛය | ප්‍රජාව/ප්‍රතිලාභීන් සඳහා අපේක්ෂිත මහජන සේවාවන් ලැයිස්තුව සකස්කර ප්‍රදර්ශනය කර නොතිබුණි. | මහජන සේවාවන් ලැයිස්තුව ප්‍රදර්ශනය කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ඉ) | අනෙකුත් චක්‍රලේඛ 2018.07.19 දිනැති අංක 2018/e පළාත්පාලන - 01 දරන චක්‍රලේඛය | ප්‍රජාවට අන්තර්ජාලය මාර්ගයෙන් සේවාවන් ලබාගැනීමේ පහසුකම් සලසා දී නොතිබුණි. | අපගේ සභාව ඉතාමත් අඩු ආදායමක් ලබන සභාවක් බැවින් දැනට අන්තර්ජාල පහසුකම් මහජනතාවට සැපයීමට කටයුතු කළනොහැකිව පවති. | චක්‍රලේඛය ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

**1.4.2** බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව අදාල ඇතැම් ඉඩම් විකුණුම් මත සියයට 1 ක විකුණුම් බදු අයකළ යුතු වුවත් සභාව විසින් ඒවා අයකිරීමට කටයුතු කර නොතිබුණි. | මේ දක්වා අප සභා බල ප්‍රදේශය තුළ වෙන්දේසියේ විකිණීම් සිදු නොවීය. | ප්‍රාදේශීය සභා පනත අනුව අදාල කටයුතු සිදුකළ යුතු වේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,836,824 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,934,011 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | 2018 | |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම |
| | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,510,000 | 5,994.360 | 10,000 | 10,060 |
| කුලී | 1,878.000 | 1,730,640 | 2,202,200 | 2,024,131 |
| බලපත්‍ර ගාස්තු | 291,220 | 402,663 | 269,975 | 328,170 |
| වෙනත් ආදායම් | 29,515,689 | 29,751,375 | 29,638,381 | 33,331,107 |
| | 35,194,909 | 37,879,038 | 32,120,556 | 35,693,468 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සුසාන භූමි 05ක් සඳහා සභාව විසින් සංවර්ධන ක්‍රියාමාර්ගයන් ගෙන තිබුණත්, මළ සිරුරු පිළිස්සීම සඳහා අනුමැතිය ලබාගෙන පිළිස්සීම සිදු කර නොතිබුණු අතර ඒ සඳහා සුසාන භූමි බදු ද සභාව විසින් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සුසාන භූමි සඳහා මූලික පහසුකම් සලසා දීමෙන් පසුව බදු අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | සුසාන භූමි බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තියට අනුව, සභාව විසින් මහජන සෞඛ්‍ය උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳව සියලු කරුණු පාලනය කිරීම් හා පරිපාලනය, සාමාන්‍ය ජනතාවගේ සුබවිහරණය, පහසුකම් සහ සුභසාධනය සහ ආරක්ෂාව සහ වැඩිදියුණු කිරීම පිළිබඳව හෙළිවු කරුණු පහත සඳහන් පරිදි විය.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, මූලික කරුණු 30ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර තිබුණත්, සියළුම කාරණා ක්‍රියාත්මක කර නොතිබුණි. | සියළුම කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. | අදාල පනතට අනුව සකස් කළ අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාත්මක ගත යුතු වේ. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 30 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2020 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. | අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව අදාල ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. |

(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා කරගැනීමට අපොහොසත් වීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කසුරිනා වෙරළතීරය අලංකාර කිරීමත්, පාරම්පරික හොජුන් හල, වැසිකිලි සහ ළමා උද්‍යානය ඉදිකිරීමේ ක්‍රියාකාරකම් සඳහා වැයකළ රු.15,827,506 කින් අපේක්ෂා කළ ප්‍රතිඵල ළඟා කරගෙන තිබුණද, එමගින් අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා කරගත නොහැකි වී තිබුණි. | 2020 වර්ෂ ආරම්භයේ කාන්තා මූලික කරගත් පවුල් සඳහා ලබාදීමට ක්‍රියාමාර්ග ගෙන තිබුණත්, දැනට අදාල ක්‍රියාකාරකම් නවතා ඇත. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් එක් ක්‍රියාකාරකමකින් අපේක්ෂා කළ ප්‍රතිලාභ ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන සහකාර විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් නොකිරීමෙන් ප්‍රදේශයට අදාල මූලික කාර්යයන් ඉටු නොවී පැවැතුණි. | ඉදිරි කාලයේදී නියමිත කාල පරාසය තුළ වාර්තා ඉදිරිපත් කරනු ලැබේ. | පළාත් පාලන සහකාරවරයා විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලය තුළ සකස් කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රාදේශීය සභාව විසින් මහජන සේවාවන් ලැයිස්තුවක් ප්‍රදර්ශනය කර තිබුණත්, එහි සඳහන් කරුණුවලට පටහැනිව මහජනතාවට සලසා තිබු සේවාවන් කාල ප්‍රමාදයකින් පසුව ඉටු කර තිබුණි. | ඇතැම් අවස්ථාවල ප්‍රමාදයන් සිදුවී තිබුණි. | මහජනතාවට සේවාවන් නියමිත සැපයීම කාලයේ සැලසීමට උචිත ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 06ක් පිරවීමට නියමිත කාලය තුළ කටයුතු කර නොතිබුණි. | වැඩ කම්කරුවන්ගේ තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇත. | නියමිත කාලය තුළ තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුවේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් අදාල මූල්‍ය වර්ෂයේ ඉටුකළ යුතු සංවර්ධන කාර්යයන් අවසන් නොකළ රු.1,416,545ක් වෙනුවෙන් වියදම් ණයහිමියන් ගිණුමේ ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. | වියදම් ණයහිමියන් ගිණුම් ශේෂයේ ඇති රු.1,416,545ක් අය කළ යුතුව තිබුණි. | සංවර්ධන කාර්යයන් නියමිත කාලය තුළ අවසන් කළ යුතු වේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නඩත්තුව හා අලුත්වැඩියා නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් භාවිතා කළ අංක වාහනය පසුගිය 2012 වර්ෂයේ සිට අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුණද, එය අලුත්වැඩියා කිරීමට සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම වාහනය විකිණීමට හෝ වෙනත් දෙපාර්තමේන්තු වෙත භාරදීමට සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වාහන නියමිත කාලය තුළ අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතු වේ. |

**3.6 ප්‍රසම්පාදනය**

**-------------**

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

**---------------------**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් සේවාවන් වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. | 2020 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රාදේශීය සභාවව විසින් සේවාවන් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුය. |